# චක්‍රීය චින්තනයේ මහිමය

එක් චිත්තයක් නැතිවී යනවිට එහි විඥාපන අනුගාමී චිත්තයට ලබාදෙන චිත්ත අනුක්‍රමයක් විසින් මනස නිර්මාණය කෙරෙන්නේ යැයි අපි කීවෙමු. ඒ අනුක්‍රමය ම මනස බැවින් මෙයින් කියැවෙන්නේ මනස විසින් මනස නිර්මාණය කරනු ලැබීම ය. එහෙත් අප විසින් මෙසේ නිර්මාණය කෙරී ඇත්තේ අප මනස යැයි කියන්න සඳහා ආකෘතියක් පමණක් වෙයි. මෙහි දී නැවතත් අවධාරණය කළ යුතු වන්නේ මේ මනස පිළිබඳ ආකෘතියක් නොවන බව ය. මනස පිළිබඳ ආකෘතියක් යැයි කී විට ඉන් හැඟෙන්නේ මනස යනුවෙන් දෙයක් පවතින බවත් අප ඒ පිළිබඳ ආකෘතියක් ගොඩනගා ඇති බවත් ය. එහෙත් මනස යනුවෙන් එලෙස යමක් අපෙන් තොරව පවතින්නේ නො වෙයි. මනස යනුවෙන් හඳුන්වනු ලබන්නක් තේරුම්ගැනීමට අපට සිදු වී ඇත. තේරුම්ගැනීම යනු ම ආකෘතියක් නිර්මාණය කිරීම ය. අපි නැති පුටුවක්, පුටුවක් ලෙස ගනිමු. එසේ ගන්නේ ඒ පිළිබඳ සංකල්පයක් ද එනම් පුටුව යන සංකල්පය ද ගොඩනගමින් ය. පුටුව තේරුම්ගැනීම සඳහා ඒ සංකල්පයෙන් ඔබ්බට ගිය ප්‍රවාදයක් නිර්මාණය කිරීමට අවශ්‍ය වෙයි. මනස සම්බන්ධයෙන් ද එසේම ය. නැති මනසක් අපි මනසක් ලෙස ගනිමු. දැන් අපි ඒ මනස තේරුම්ගැනීම සඳහා ප්‍රවාද, ආකෘති ගොඩනගන්නෙමු. ඉහතින් සඳහන්වුයේ එවැනි ආකෘතියක් මිස ඇති මනසක් පිළිබඳ ව වූ ආකෘතියක් නො වෙයි.

දැන් තවත් ප්‍රශ්නයක් වෙයි. මනස යැයි අප ගන්නා දෙයෙහි ආකෘතිය නිර්මාණය කරන්නේ ද මනස ම ය. මෙය පුටුව තේරුම් ගන්නේ ද ආකෘති ඔස්සේ වුව ද එහි දී ආකෘති නිර්මාණය කෙරෙන්නේ පුටුව විසින් නොව මනස විසින් ය. එහෙත් මනසෙහි ආකෘති ගොඩනගන්නේ ද මනස ය. චිත්තය යන්න ද මනසෙහි නිර්මාණයකි. අනිත්‍ය අවබෝධකිරීමට නොහැකි අපි මනසින් ආකෘති ගොඩනගමු. චිත්තය පමණක් නොව සංසාරය. කර්මය ආදිය ද මනසෙහි ම නිර්මාණ වෙයි. සංසාරය හා කර්මය බුදුන්වහන්සේගේ නිර්මාණ නො වෙයි. ඒ සංකල්ප වෛදික සමාජයෙහි ද තිබිණි. කර්මවාදය යන්න ද වෛදිකයන්ගේ නිර්මාණයකි. ඒ ප්‍රවාදයකි. සත්ත්වයා සසර සැරිසරන්නේ කෙසේ ද, කිනම් කරුණක් නිසා ද වැනි ප්‍රශ්නවලට වෛදිකයන් දුන් පිළිතුර කර්මවාදය නමැති ප්‍රවාදයෙහි වෙයි. බුදුන්වහන්සේ ප්‍රවාද නිර්මාණය කෙළේ යැයි නො සිතමි. උන්වහන්සේට අවශ්‍ය වුයේ ඉපදීම අවසන්කිරීමට ය. ඉපදීම අවසන් වන්නේ නිවන් අවබෝධයෙන් ය. නිවන මනසෙහි නිර්මාණයක් නො වෙයි. මාධ්‍යමිකවාදය බිහිකළ නාගර්ජුන හාමුදුරුවන් වරද්දා ගත්තේ ද මෙතනදී ය. උන්වහන්සේ නිවන සංසාරයට සාපේක්ෂව මනසින් දැනගන්නා ධර්මතාවක් බවට පත්කළහ. නිවන අවබෝධකළ හැක්කේ මනසින් නොවෙයි.

මනස නම් ආකෘතියෙහි ඇති චක්‍රීයභාවය තේරුම්ගැනීමට උත්සාහකරමු. මනස නමැති ආකෘතිය ගොඩනැගෙන්නේ මනස විසින් ය. ඒ මනස නම් ආකෘතිය ගොඩනැගෙන්නේ චිත්තය නම් සංකල්පය ඇසුරෙන් ය. එහෙත් චිත්තය ද මනස විසින් නිර්මාණය කෙරෙන්නෙකි. අපේ ආකෘතිය, එනම් මනස නම් ආකෘතිය යනු එක් එක්හි අවසානයේ දී තමන් සතු විඥාපන (තොරතුරු) අනුගාමී චිත්තයට ලබාදෙන චිත්ත අනුක්‍රමයකි. එහෙත් මනස යනුවෙන් හෝ චිත්තය යනුවෙන් හෝ අවස්ථායීභාවයක් (substantive state) ඇත්තේ නො වෙයි. මේ සියල්ල මනසේ මනස්කාර ය. මනස ද මනස්කාරයක් වෙයි.

අනිත්‍ය අනාත්ම අවබෝධකිරීමට නොහැකි පෘථග්ජන පුද්ගලයා මනසක් ඇතැයි ගනියි. මෙහි දී පුද්ගලයා යන්න වෙනුවට සත්ත්වයා යන්න යෙදීමෙහි වරදක් නැත්තේ සතුන් ද එලෙස ක්‍රියාකරන බැවින් ය. එලෙස මනසක් ඇතිකරගන්නා සත්ත්වයා ඒ මනසින් මනස ද ඇතුළු පුටුව, මේසය වැනි සියළු සංකල්ප නිර්මාණයකරයි. චිත්තය යන්න ද මිනිසුන් විසින් නිර්මාණය කෙරී ඇති සංකල්පයකි. චිත්ත අනුක්‍රමය හෙවත් චිත්ත පරම්පරාව යන්න ද එවැනි ම වූ නිර්මාණයකි. අප විසින් කෙරී ඇත්තේ අනුගාමී චිත්තයකට පුරෝගාමී චිත්තයෙහි විඥාපන ලැබෙන්නේ යැයි කියමින් ප්‍රවාදයක් සකස්කිරීම, නිර්මාණයකිරීම පමණකි. මෙහි දී නැවත නැවතත් කිවයුතු කතාව වන්නේ වෙනස්වන චිත්තයෙහි විඥාපන ද සුළු වශයෙන් හෝ වෙනස්වන බවත් චිත්තයක් අනුගාමී චිත්තයට ලබාදෙන්නේ එය තම පුරෝගාමී චිත්තයෙන් ලබාගත් විඥාපන ම නොවන බවත් ය. එමෙන් ම මෙහි දී චිත්තය ලෙස ගැනෙන්නේ අභිධර්මයෙහි සඳහන් චිත්තය බවත් ඒ චිත්තය යනු අනෙක් ඉන්ද්‍රියයන්හි ආධාරයෙන් තොරව මනසට ගතහැකි

© Prof. Nalin De Silva

කුඩාම ධර්මය ලෙස අප විසින් හඳුනාගැනෙන බවත් සඳහන් කළයුතු ය. එහෙත් චිත්තයක් යනුවෙන් අවස්ථායීභාවයක් නැති බවත් අප මතක තබාගත යුතු ය.

එලෙස චිත්ත යනුවෙන් අවස්ථායීභාවයක් නැතත් මනස හා වෙනත් දෑ තේරුම්ගැනීම සඳහා චිත්ත යන සංකල්පය උපකාරී වෙයි. සංකල්ප, ප්‍රවාද නිර්මාණයෙහි දී අවශ්‍යවන්නේ හැකිතාක් දුරට සංගත වීම ය. පරස්පර නොමැතිව සංකල්ප, ප්‍රවාද ඉදිරිපත්කිරීමට උත්සාහ කළයුතු වෙයි. එහෙත් මෙහි දී කිවයුත්තක් වෙයි. පරස්පර යන්න ද සාපේක්ෂ වූවක් ය. යමක් පරස්පරයක් ද නැත් ද යනු තීරණය කෙරෙන්නේ න්‍යාය විසින් ය. ඒ ඒ න්‍යාය විසින් පරස්පර ලෙස සැලකෙන්නේ එකම දෙයක් නො වෙයි.

උදාහරණයක් ලෙස ගතහොත් මනස විසින් මනස නිර්මාණය කෙරෙන්නේය යන්න ඒක රේඛීය චින්තනයක පරස්පරයක් වෙයි. යමක් විසින් එය නිර්මාණය කෙරෙන්නේ කෙසේ ද යන්න ඒක රේඛීය චින්තනයකට ප්‍රශ්නයක් වෙයි. යමක් වෙනත් දෙයක් නිර්මාණය කිරීම මේ චින්තනයෙහි සැමවිට ම අපේක්ෂා කෙරෙයි. එහෙත් චක්‍රීය චින්තනයක එය ප්‍රශ්නයක් නො වෙයි. එහි අනෙක් පැත්ත ද වෙයි. මනස විසින් මනස නිර්මාණය කෙරෙන්නේ ය වැනි ප්‍රවාදයක් සංගතවන්නේ චක්‍රීය චින්තනයක ය. අපි අපේ ප්‍රවාද නිර්මාණයකිරීමේ දී චක්‍රීය චින්තනයක පිහිටමු. එසේ ම එහි දී අපි ද්විකෝටික න්‍යාය නොව චතුස්කෝටික න්‍යාය යොදා ගන්නෙමු.

ද්විකෝටික න්‍යායෙහි පරස්පරවන දෑ චතුස්කෝටික න්‍යායෙහි පරස්පර නො වෙයි. එයට හේතුව චතුස්කෝටික න්‍යායෙහි A = B හා A ≠ B එකට පැවතීමට හැකිවීම ය. එලෙස එකට පැවතීම ද්විකෝටික න්‍යායට අනුව පරස්පරයකි. එහෙත් චතුස්කෝටික න්‍යායට අනුව පරස්පරයක් නො වෙයි. චිත්තය සම්බන්ධයෙන් ගත්කල වුව ද චිත්තය ආරම්භයෙහි දී එහි පුරෝගාමී චිත්තයට විඥාපන වශයෙන් ගත්කල සමාන වුව ද අවසානයේ දී එයට සමාන නො වෙයි. වෙනස යන්න කෙලෙසකට තේරුම්ගැනීමට උත්සාහ කළත් ඒක රේඛීය චින්තනයෙහි පරස්පර ඇතිවෙයි.

එහෙත් මෙහි දී යමකුට කිවහැක්කේ චතුස්කෝටිකය එවැනි අවස්ථාවල පරස්පරවලින් මිදෙන්නේ A = B හා A ≠ B එකට පැවතීමට හැකිවන ලෙස අර්ථදක්වමින් බව ද එසේ අර්ථදැක්වීම ම වැරදි බව ය. එහෙත් තවත් යමකුට කිවහැක්කේ A = B හා A ≠ B එකට නොපවතින ලෙස අර්ථදැක්වීම ම වැරදි බව ය. අප කලින් ද සඳහන්කර ඇති පරිදි න්‍යාය (logic) යනු දේවභාෂිතයක් නො වෙයි. න්‍යාය ද මිනිසුන්ගේ නිර්මාණයකි. මිනිසා ද්විකෝටික න්‍යාය නිර්මාණය කරගෙන ඇත්තේ තම එදිනෙදා අත්දැකීම් ආශ්‍රයෙන් වියුක්ත පද්ධතියක් ගොඩනගා ගනිමින් ය. එදිනෙදා අත්දැකීම් සම්බන්ධයෙන් ගත්කල ද්විකෝටික න්‍යාය සංගත වෙයි. පෑනක් යනු පෑනක් මිස පැන්සලක් නො වෙයි. පෑන පවතින තුරු එය පෑනක් නොවන්නේ නො වෙයි. ඒ පිළිබඳ විවාදයක් නැත. චතුස්කෝටිකයෙහි ද ද්විකෝටිකය අන්තර්ගතවන බැවින් එවැනි අවස්ථා චතුස්කෝටික න්‍යායට ප්‍රශ්නයක් නො වෙයි.

ද්විකෝටික න්‍යායෙහි ප්‍රශ්න ඇතිවන්නේ වෙනස්වීම තේරුම්ගැනීමට ගියවිට ය. වෙනස්වීම යන්න අප තේරුම්ගැනීමට උත්සාහකරන්නේ වෙනස්නොවන වස්තූන්ගේ ආධාරයෙන් බැවින් එලෙස ප්‍රශ්න පැනනගියි. එවැනි අවස්ථාවක, එනම් වෙනස්වීම යනු කුමක් දැයි එලෙස වෙනස්නොවන වස්තූන්ගේ ආධාරයෙන් තේරුම් ගැනීමට ගියවිට අපට චතුස්කෝටිකය අවශ්‍ය වෙයි. (චතුස්කෝටිකය වෙනත් කරුණුවලදී ද අවශ්‍ය වෙයි.) පැරණි භාරතීයයන් (ප්‍රාග් වෛදිකයන් යැයි සිතිය හැකි ය.) චතුස්කෝටිකය නිර්මාණය කරගන්නට ඇත්තේ එවැනි වූ ඔවුන්ගේ අත්දැකීම් පදනම්කරගනිමින් යැයි කිව හැකි ය. කලනය යනු වෙනස්වීම අධ්‍යයනයකිරීම සඳහා බටහිර ගණිතය විසින් නිර්මාණය කෙරී ඇත්තකි. එය අද ඉගැන්වෙන්නේ ද්විකෝටිකය ඇසුරෙන් ය. ඒ නිසා ම එහි පරස්පර වෙයි. අපි එය පසුව සාකච්ඡා කරමු.

මනස භෞතිකවාදය හා විඥානවාදය යන ලිපිය අවසානයෙහි අපි ප්‍රශ්න දෙකක් ඇසුවෙමු. පළමු ප්‍රශ්නය වූයේ මනස මනසෙහි ම නිර්මාණයක් වන්නේ කෙසේ ද යන්න ය. දෙවැන්න දෙවියන් වහන්සේ යනු දෙවියන් වහන්සේගේ ම නිර්මාණයක් යැයි ගැනීමට නො හැකි ද යන්න ය. පළමු ප්‍රශ්නයට දැන් සෑහීමකට පත්විය හැකි පිළිතුරක් ලැබී ඇතැයි සිතමු. දෙවැනි ප්‍රශ්නය අසා ඇත්තේ නොහැකි ද යන ආකාරයට ය. ඒ ප්‍රශ්නය එසේ ඇසීමට හේතුවූයේ කුමක් ද යන්න දැන් සලකා බලමු.

© Prof. Nalin De Silva

මේ ප්‍රශ්න දෙක ම ඇසීමට හේතුව වුයේ යමක ආරම්භය ගැන, යමක් නිර්මාණය කරන්නේ කවුද කෙසේ ද ආදී ප්‍රශ්න සාකච්ඡාවට ගැනීම ය. යමකට හේතුව කුමක් දැයි ඇසීම ද ඒ ප්‍රශ්න ම තවත් ආකාරයකට ඇසීමක් වෙයි. මේ හේතු නැත්නම් නිර්මාණ කෙරෙන්නේ කෙසේ ද ආදිය මුල හේතුවකින් කෙළවර වෙයි. අපට මනස මනසේ ම නිර්මාණයක් වන්නේ කෙසේ ද යන්න ඇසීමට සිදු වූයේ ද එවැනි පසුබිමක ය. සියළු සංකල්ප, ප්‍රවාද නිර්මාණය කෙරෙන්නේ මනස විසින් නම් මනස නිර්මාණය කරන්නේ කවුද කෙසේ ද යන ප්‍රශ්නයට දෙන පිළිතුර කුමක් ද? ඒක රේඛීය චින්තනයක නම් මනස නිර්මාණයවීමට හෝ කිරීමට වෙනත් යමක් තිබිය යුතු ය. එහෙත් චක්‍රීය චින්තනයක එය එසේ විය යුතු නො වෙයි. චක්‍රීය චින්තනයක මනස මනසෙහිම නිර්මාණයක් විය හැකි ය. අපට ඇති වූ ප්‍රශ්නය වූයේ මනස එලෙස මනසෙහි ම නිර්මාණයක් වන්නේ කෙසේ දැයි පැහැදිලි කිරීම ය. භෞතිකවාදීන් මෙන් මනසින් තොරව පවත්නා ලෝකයක් උපකල්පනය නොකර එමෙන් ම විඥානවාදීන් මෙන් පරම ව පවත්නා මනසක් උපකල්පනය නොකර සිංහල බෞද්ධයනට භෞතිකවාදී ද විඥානවාදී ද නොවන දාර්ශනික පද්ධතියක් ගොඩනගාගත හැක්කේ ඒ අයුරින් ය.

දෙවියන් වහන්සේ පිළිබඳ ප්‍රශ්නය ඇසීමට සිදුවන්නේ ද නිර්මාණය පිළිබඳ ප්‍රශ්නය මුල්කරගනිමිනි. විඥානවාදී ස්ථාවරයට අනුව සියල්ල මනසෙහි නිර්මාණ වෙයි. එහෙත් මේ නිර්මාණ සියල්ල යම් පුද්ගලයකුගේ මනසෙහි සිදුකෙරෙන නිර්මාණ වීම අවශ්‍ය නොවේ. ඇතැම් නිර්මාණ පුද්ගලයාගේ මනසෙහි නිර්මාණය වුව ද තවත් නිර්මාණ ද ඒ පුද්ගල මනස් ද සුපිරි මනසක් විසින් නිර්මාණය කෙරෙයි. එවිට පුද්ගල මනස් නිර්මාණය කරන්නේ කවුද යන ප්‍රශ්නයට පිළිතුරක් ලැබෙයි. දැන් ප්‍රශ්නය වන්නේ ඒ සුපිරි මනස, එනම් දෙවියන් වහන්සේ නිර්මාණය කෙළේ කවුද යන්න ය. ඒ ප්‍රශ්නයට පිළිතුරක් ලෙස දෙවියන් වහන්සේ ම දෙවියන් වහන්සේ නිර්මාණය කෙළේ යැයි කිව නො හැකි ද?

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva